# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2001/3 - 2017 ජනවාරි මස 09 වැනි සඳුදා - 2017.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගාල්ල නාගරික සීමා අප ජල ප්‍රතිචක්‍රියකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන අප ජල පවිත්‍රාගාරයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන අතිරේක ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 30 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1239

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර - ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 103A ගිංතොට නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නවරියන්වත්ත නමැති ඉඩමෙන් පර්චස් 05ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | බොරළු පාර ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | අපජල පවිත්‍රාගාර ඉඩම හා පාර ; |
| *බටහිරට* | : | රූපරත්න මහතා හිමිකම් කියන ඉඩම හා අඩි 3 පළල පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : අබේසේකර මහතා,
බෝපේ පාර,
ගිංතොට.

01 -728